## දකුණු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව - සංශෝධන අංක 01

| සංශෝධනය කළ යුතු පවත්නා කොටස් | යෝජිත සංශෝධනය | සංශෝධනය කිරීමට හේතුව |
|---|---|---|
| 7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්<br>(අ) භාෂාව සහ ගණිතය, ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් පහකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම. | 7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු සම්මාන පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම. | මධ්‍ය රජයේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සංශෝධන අංක 03ට සමගාමීව දකුණු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. |
| 7.2.2.2 වෘත්තීය සුදුසුකම්<br>(අ)තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමේ හෝ ඊට ඉහළ පරිගණක/ තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හදාරා තිබීම. | 7.2.2.2 වෘත්තීය සුදුසුකම්<br>(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක්/උසස් ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක/තොරතුරු තාක්ෂණය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හෝ පැය 1500කට නොඅඩු පාඨමාලාවක් හෝ හදාරා සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>(iii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන එම කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයකින් හෝ පාර්ලිමේන්තුවේ සම්මත පනතක් මඟින් ස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකින්,<br>(අ) පරිගණක/ තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ | මධ්‍ය රජයේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සංශෝධන අංක 02ට සමගාමීව දකුණු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ වෘත්තීය සුදුසුකම් සංශෝධනය කිරීම. |

උසඅ
ආණ්ඩුකාරතුමා
2023/12/08
04
2023/12/

| | | |
|---|---|---|
| | ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) හෝ ඊට ඉහළ සහතිකය ලබා තිබීම.<br><br>හෝ<br><br>(ආ) පැය 1500ට නොඅඩු පරිගණක/ තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම. | |
| 7.3.2.2.3 පළපුරුද්ද:<br>(අ) i. 3වන පන්තියේ I ශ්‍රේණියේ වසර හතරක (04) සේවා කාලයක් සමඟ පූර්වාසන්න වසර 5 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.<br><br>සහ<br><br>ii. 3වන පන්තියේ I වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම<br><br>හෝ<br><br>(ආ) i. 3වන පන්තියේ II ශ්‍රේණියේ නිලධරයකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් තිබීම.<br><br>සහ<br><br>ii. මෙම සේවා ව්‍යවස්ථාවේ 7.3.1.2.1 හි අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම. | 7.3.2.2.3 පළපුරුද්ද:<br>(අ) i. සේවයේ 3 පන්තිය I ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.<br><br>සහ<br><br>ii. ඉවත් කරනු ලැබේ.<br><br>හෝ<br><br>(ආ) i. සේවයේ 3 පන්තිය III ශ්‍රේණියේ වසර 5ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පත්වීම ස්ථිර කළ නිලධරයෙකු වීම හා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.<br><br>සහ<br><br>ii. මෙම සේවා ව්‍යවස්ථාවේ 7.3.1.2.1 හි අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.<br>සටහන: 7.3.1.2.1(4)(ii)හි සඳහන් වෘත්තීය පළපුරුද්ද සීමිත බඳවාගැනීමේ අයදුම්කරුවන්ට අදාළ නොවේ. | දකුණු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා වෘත්තිකයන්ගේ සංගමයේ ලේකම්ගේ අංක SPICTS/class2 හා 2023.02.17 දිනැති ලිපිය මඟින් කර ඇති ඉල්ලීම අනුව සහ මධ්‍ය රජයේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සංශෝධන අංක 02 හා 03ට සමගාමීව දකුණු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. |

254
ආණ්ඩුකාරතුමා
2023/12/08
04
2023/12/13

| | | |
|---|---|---|
| 10.1.1.1<br>iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br><br>10.2.1.1<br>iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br><br>10.3.1.1<br>iv. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | 10.1.1.1<br>iv. උසස් කිරීමේ දිනට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.<br><br>10.2.1.1<br>iii. උසස් කිරීමේ දිනට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.<br><br>10.3.1.1<br>iv. උසස් කිරීමේ දිනට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම. | මධ්‍ය රජයේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සංශෝධන අංක 03ට සමගාමීව දකුණු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. |

- මෙම සංශෝධනය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දිනයේ සිට බලාත්මක වේ.

සකස් කලේ :
අත්සන : ..............................
නම : ඩී.ඒ.ජේ.චබෝධා අයේෂානි
තනතුර : කළමනාකරණ සේවා නිලධාරී III
දිනය : 2023/11/07

පරීක්ෂා කලේ :
අත්සන : ..............................
(විෂයය භාර මාණ්ඩලික නිලධාරියා)
නම : බී.එම්.මදූෂා ජනෝෂි
තනතුර : සහකාර ප්‍රධාන ලේකම් (පිරිස්)
දිනය : 2023/11/07

බී. එම්. මදූෂා ජනෝෂි
සහකාර ප්‍රධාන ලේකම් (පිරිස්)
නිල මුද්‍රාව: ..............................

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................
නම : ආර්.එච්.කමල් රණසිංහ
තනතුර : නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
දිනය : 2023/11/07

නිල මුද්‍රාව: ..............................

254
ආණ්ඩුකාරතුමා
2023/12/08
04
2023/12/08

යොමු අංකය: CSS/2/6/2/39(1)

දකුණු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව - සංශෝධන අංක 01 ඉහත පරිදි සංශෝධනය කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම් (දකුණු පළාත)

දිනය : 2023/11/07

නිල මුද්‍රාව : ..............................

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:

නිර්දේශ කරමි.

1. ජී.හේවාවිතාරණ මයා (සභාපති) ..............................
2. දයාපාල ඩබ්.විතාරණ මයා (සාමාජික) ..............................
3. කේ.කේ.ජී.ජේ.කේ.සිරිවර්ධන මයා (සාමාජික) ..............................
4. එස්.විජේසේකර මයා (සාමාජික) ..............................
5. සුනිල් දහනායක මයා (සාමාජික) ..............................
6. එම්.හාල්පන්දෙණිය මයා (සාමාජික) ..............................
7. එම්.වයි.එස්.දේශප්‍රිය මයා (සාමාජික) ..............................

ආණ්ඩුකාරවර ලේකම්,

2023/11/22 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 123/2023(11)/07 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද දකුණු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව - සංශෝධන අංක 01 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණික ව ඉදිරිපත් කරමි.

දිනය : 2023/11/30

..............................
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අනුමත කරමි/නොකරමි.

දිනය : 2023.12.08

..............................
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර

ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්.ගමගේ
ආණ්ඩුකාරවර
දකුණු පළාත